ශීර්ෂය 016 - පාර්ලිමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 016 - පාර්ලිමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 18 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	පාර්ලිමේන්තුව සතු ජයන්තිපුර පිහිටි ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්ගත කර නොතිබීම.	3.3

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු.රෙ 66 මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු වැය විෂයයන් 02ක හා තවත් වැය විෂයයන් 14 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සියයට 06 සිට සියයට 240 දක්වා පරාසයකින් වැඩිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 06ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සියයට 06 සිට සියයට 29 දක්වා පරාසයකින් අඩු කරගෙන තිබුණු බැවින් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මු.රෙ. 50 ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	සමාලෝචිත වර්ෂයේ මු.රෙ. 66 මගින් මාරු කරගෙන තිබුණු රු.30,700,000ක සහ රු.4,500,000 ක විදේශ ප්‍රදාන හා පරිත්‍යාග ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ලැබුණ වත්කම් ගිණුම්ගත කිරීමට භාවිත කර ඇති අතර ප්‍රතිපාදන ඌනතාවයන් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉතිරි වීම් ඇතිවන වැය විෂයයන් හඳුනාගෙන එම ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කර ගෙන ඇති බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 30 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.827,600,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.504,116,680 ක් හෙවත් සියයට 16 සිට සියයට 91 දක්වා සහ තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.402,100,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.644,104,350 ක් හෙවත් සියයට 39 සිට සියයට 96 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වි තිබුණි	9 වැනි පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා වූ ඉතුරුවීම්, අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම, විශාල පරිමාණයේ අලුත්වැඩියා කටයුතු සිදු නොවීම සහ වියදම් පාලනය හේතුවෙන් සත්‍ය වියදම් ප්‍රමාණය අඩු විම වැනි හේතු නිසා මෙම පුනරාවර්තන වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන ඉතුරු වී ඇති බවද අපේක්ෂිත පරිදි විශාල පරිමාණයේ අලුත්වැඩියා කටයුතු සිදු නොවීම, ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් අපේක්ෂා කළ පරිදි සම්පූර්ණ කළ නොහැකි වීම සහ මූලධන වත්කම් අත්පත් කර ගැනීම බලාපොරොත්තු වූවාට වඩා ප්‍රමාද වීම වැනි හේතු නිසා ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන ඉතුරු වී ඇති බවද දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ මු.රෙ.66 මඟින් මාරු කරගෙන තිබුණු එකතුව රු.65,590,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.9,186,273 ක් හෙවත් සියයට 04 ත් සියයට 71 ත් අතර පරාසයකින් ඉතිරි කර තිබුණි.	9 වැනි පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම සහ අපේක්ෂිත පරිදි විදෙස් සංචාරයන් සහ පුහුණු වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් මු.රෙ. මගින් මාරු කර ගත් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය
(ඈ)	2024 ජනවාරි 10 දිනැති අංක 1/2024 දරන අයවැය චක්‍රලේඛයේ 13 වගන්තිය අනුව අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරු කිරීම් සලකා බලනු ලබන අතර ඒ සඳහා වන සියලුම ඉල්ලීම් අදාළ මුදල් වර්ෂයේ නොවැම්බර් මස 30 ට පෙර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළයුතු වුවත් පාර්ලිමේන්තුවේ මුළු වැය විෂයය මාරු කිරීම් වූ රු.130,087,000 න් රු.46,797,000 ක් එනම් සියයට 36 ක් නොවැම්බර් මස 30 දිනට පසුව ඉදිරිපත් කර තිබූ අතර ඒ තුළ 2025 ජනවාරි මාසයේ තුළ මාරු කිරීම් රු.17,797,000ක ප්‍රමාණයක් විය.	ගිණුම් පියවීමේ කාල සීමාව 2025 ජනවාරි 02 දින දක්වා දීර්ඝ කිරීම නිසාත් 9 වන පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ 10 වන පාර්ලිමේන්තුව ආරම්භ වීම 2024 සැප්තැම්බර් හා නොවැම්බර් කාල පරාසය තුල සිදුවීම නිසා 2024 නොවැම්බර් 30 දිනට වැය විෂයයන්ගේ ඌනතාවයන් සහ ඉතිරිවීම් නිවැරදි ව පුරෝකථනය කිරීමේ දුෂ්කරතාවය නිසා මෙම තත්ත්වය තුල 2024 නොවැම්බර් 30 දින වන විට මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් ගණනය කිරීම ප්‍රායෝගිකව සිදු කිරීමට නොහැකි වූ බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාරය වෙත වාර්තා නොකල කිසිදු බැඳිමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදම් ලෙස ඉදිරි වර්ෂයේදී නිරවුල් නොකල යුතු වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් නොවූ සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.15,687,145 ක වියදම 2025 වර්ෂයේදී ගෙවීම් කර තිබූ අතර එම බැරකම් පිළිබඳ විස්තර බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනෙන් පසු ලද ජල, විදුලි හා දුරකථන බිල්පත්වල බිල්පත් දිනය දෙසැම්බර් 31 දිනට පසු දිනයන් බැවින් බැරකම් ප්‍රකාශයේ එම බිල්පත් බැරකම් ලෙස ඇතුළත් කිරීමට නොහැකි බවද විනය පරීක්ෂණ ගාස්තු වූ රු.225,000 ක බිල්පතද 2024 වර්ෂයේ 4 වැනි කාර්තුවට අදාළ මුද්දර බදු මුදල 2024 දෙසැම්බර් 31 දිනට පසු ලැබීම නිසා බැරකම් ලෙස සලකා නොමැති බව දක්වා ඇත.	වර්ෂයට අදාළ සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව රු.7,820,000 ක් වූ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් තුල ඇතුළත් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 වන ඡේදය අනුව මාර්ගෝපදේශ 14 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 4 වන පරිච්ජේදය මඟින් ආයතනයේ කාර්යයසාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඉදිරිපත් කල යුතු වුවත් එසේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්යසාධන දර්ශක ඉදිරිපත් කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදය ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සිදු කොට වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කරනු ලබන බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 6.2 වන පරිච්ඡේදය මගින් ආයතනයේ මානව සම්පත් සංවර්ධනය යටතේ සේවක පුහුණුවීම් පිළිබඳව නියමිත ආකෘතියෙන් තොරතුරු ඉදිරිපත් කලයුතු වුවත් එසේ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂ සඳහා කාර්යසාධන වාර්තා පිළියෙළ කිරීමේදි ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දුන් බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දිනට පෙර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මාස 03 ක කාල පමාවකින් පසුව විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එය ගණන්දීමේ නිලධාරී විසින් අනුමත කර නොතිබුණි.	2024 වසර සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීම නිසි පරිදි සිදු කළ නමුත් අදාළ කාල රාමුවට අනුගතව සිදු කරන ලෙස නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇති බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය
(ආ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ වැඩ සඳහා (civil works) රු.264,825,000 ක මුදලක් වෙන් කර තිබුණද වර්ෂ අවසානයේ එහි ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් සැලැස්මේ ඵලදායීතාවය ඇගයීමට ලක් කළ නොහැකි විය.	ප්‍රසම්පාදන සැලැස්මේ සැලසුම් කළ වැඩ සිදු නොකළ අතර, වෙන් කළ රු.264,825,000 ක මුදලින් රු.63,846,857 ක වැඩ සඳහා ප්‍රසම්පාදන සිදු කරන ලද අතර, එහි ප්‍රගතිය 2024 වසර සඳහා වන සංශෝධිත කාර්යසාධන වාර්තාවට ඇතුළත් කොට ඇති බව දක්වා ඇත.	වර්ෂයට අදාල ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

4.3 වත්කම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව 2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරනු ලබන බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2017 මැයි 04 දින නිකුත් කර ඇති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් පරිශීලනය කරනු ලබන පාර්ලිමේන්තුවේ පුස්තකාල පොත් සඳහා වාර්ෂික සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	භාණ්ඩ සමීක්ෂණය වර්ෂයක් පාසා අනෙකුත් අංශයන් සඳහා සිදු කරන නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භාවිතය වෙනුවෙන් පවතින පුස්තකාලයේ පොත්පත් සමීක්ෂණය වාර්ෂිකව සිදු කිරීම පසුගිය වසර වල අතපසු වුවද 2023 වසර සඳහා වාර්තාව සහ පරිගණකගත කේත ක්‍රමය මගින් වාර්ෂිකව සිදු කොට වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.4 කලමණාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කල හා සේවය හැර ගිය නිලධාරින්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ණය ශේෂය රු.2,177,604 ක් වූ අතර ඒ තුළ වර්ෂ 1ත් 3ත් අතර	මියගිය නිලධාරියෙකුගේ රු.6,064 ක ණය මුදල මේ වන විට අයකරගෙන ඇති අතර.රු.398,701 ක ණය මුදල වැඩ තහනම් කල නිලධාරීන්	අයවියයුතු ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

	අයවියයුතු ණය ශේෂය රු.850,744 ක් වූ අතර වර්ෂ 10කට අධික කාලයක් ඉක්ම වූ වැඩ තහනම් කල නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂය රු.398,701 ක් වී තිබුණි	දෙදෙනෙකුට විරුද්ධව විභාග වන නඩුව අවසන් වී නොමැති බැවින්ද අයකර ගැනීමට උත්සහ දරන බව දක්වා ඇත. රු.850,744 ක ණය ශේෂයෙන් රු.197,342 ක් ඇපකරුගෙන් අය කර ගනිමින් පවතින අතර 2025.05.25 දින වන විට එම ණය ශේෂයේ හිඟ මුදල රු.176,373 දක්වා අඩු වී ඇති බවද දක්වා ඇත.	
(ආ)	පාර්ලිමේන්තුවේ පිළිගැනීමේ තනතුරු 03 ක් ඇති කිරීම හා යෝජිත වැටුප් ක්‍රමවේදයක් සඳහා අංක 16/0190/702/006 හා 2016 ජනවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය විසින් ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීම යෝග්‍ය බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එම නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි විධිවිධාන අනුව පිළිගැනීමේ නිලධාරී තනතුර මෙන්ම පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ අනෙකුත් තනතුරු ද යෝග්‍ය පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කිරීම මේ වන විට බාහිර නිලධාරී මණ්ඩලයකින් සමන්විත කමිටුවක් මඟින් ආරම්භ කර ඇති අතර මෙම වාර්තාව කථානායකවරයාට ලැබුණු පසු එය පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත බවද දක්වා ඇත.	අදාළ පරිදි ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගත යුතුය
(ඇ)	මාදිවෙල මන්ත්‍රී නිවාස ලබා දීමේදී පාර්ලිමේන්තු මහලේකම් සමඟ ඇති කරගනු ලබන ගිවිසුමෙහි 14 වගන්තිය අනුව නිවාසවල පරිභෝජනය කරනු ලබන විදුලිය,ජලය සහ දුරකථන සඳහා සියලු ගාස්තු පදිංචිකරු විසින් නොකඩවා කලට වේලාවට ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් විදුලිය, ජලය හා දුරකථන බිල්පත් සඳහා පිළිවෙලින් රු.637,539 ක්, රු.590,860 ක් හා රු. 303,630 ක් හිඟව පැවති අතර එම මුදල් අයකර ගෙන නොතිබුණි.	හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 84 දෙනෙකුගෙන් අයවිය යුතු විදුලි ගාස්තු රු. 637,539 ක මුදල හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 86 දෙනෙකුගෙන් රු.590,860 ක් වූ ජල ගාස්තු මුදල සහ හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 83 දෙනෙකුගේ රු.303,630 වූ දුරකථන බිල්පත් නිවාස තැම්පතු මුදලින් පූර්ණ අවකරණය කිරීමටත් අනතුරුව යම් ශේෂ මුදලක් පැවතියහොත්, එය අදාළ මන්ත්‍රීවරුන් වෙත මුදා හරින ලෙසත් උපදෙස් ලබා දී ඇති බව දක්වා ඇත.	ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 1/2024 හි දක්වා ඇති පරිදි අරපිරිමැසුම්දායක ලෙස රජයේ වියදම් දැරීමත් වියදම් අවම කිරීම සඳහා වන රෙගුලාසි හා චක්‍රලේඛ දැඩිව පිළිපදිමින් ඒ ඒ ආයතන වල ස්වභාවය අනුව ගැලපෙන පරිදි වියදම් පාලන උපක්‍රම භාවිතා කල යුතු වුවද, චේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන්ගේ කාර්යාල සාරි පිරිසිදු කර දිම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 171,557 ක් වැය කර තිබුණි.	විගණනය විසින් කර ඇති නිරීක්ෂණය නිවැරදි වුවද විකල්පයක් ලෙස පාර්ලිමේන්තුව තුළ නිල ඇඳුමින් සැරසීමට ස්ථානයක් වෙන්කර දීම, සීමිත ඉඩකඩ තුළ අසීරු බැවින්ද රාජකාරී වේලාවෙන් කොටසක් වෙන් කිරීමටද සිදුවන බැවින්, එය ප්‍රා යෝගික හා පිරිවැය ඵලදායී නොවන බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	2020, 2021, 2022 සහ 2023 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල දැක්වෙන 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙත සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන සහ උපදෙස්වලට පටහැනිව, "ජ්‍යොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකුට (බලපත්‍රය හිමි තනතුරට අදාල සක්‍රීය සේවා කාලය මාස 02 ත් වර්ෂ 01 ත් අතර) සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දීර්ඝ කාලයක් භුක්ති විඳිමින් සිටි වාහන බලපත්‍ර වරප්‍රසාදය අහිමිවීම සම්බන්ධව නැවතත් බාහිර නිලධාරීන්ගෙන් සැඳුම්ලත් විද්වත් කමිටුවක් ගරු කථානායකවරයාගේ මැදිහත්වීම මත පත්කොට මේ වන විට අදාළ වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඒ වාර්තාව තුළ ඇතුළත් වන ක්‍රමවේදයට නිසි අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බව දක්වා ඇත.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය

5. මානව සම්පත් කලමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පාර්ලිමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 994 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 844 ක් වූ අතර ඒ අනුව ආයතනයේ ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 210 ක් පුරප්පාඩු වී පැවතුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයේ නොවූ සේවකයන් 13 ක් අනියම්, තාවකාලික හා වෙනත් පදනම මත බඳවාගෙන තිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇත.	ආයතනයේ කාර්යසාධනය සඳහා බලපාන පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.